දැන්වීමයි

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ
අලෙවි කළමණාකරු තනතුරේ (කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2)
III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

# Open Competitive Examination for Recruitment to the Posts of Sales Manager (Non Technical Management Assistants Category 2) Grade III for the Department of Industrial Development of Southern Province – 2021

**** විශේෂයෙන් සැළකිය යුතුයි ****

**මෙම විභාගය සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා මාර්ගගතව පමණක් අයදුම්කල යුතුය.**

**මෙම විභාගයට අදාළ කේතය - OC21602**

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින ඉහත තනතුරට බඳවා ගැනීම සඳහා මතු සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2021.04.30 දින වේ. මෙම විභාගය 2021 මැයි මසදී පවත්වනු ලැබේ.

**02.** දකුණු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ අලෙවි කළමණාකරු තනතුරේ III ශ්‍රේණියට තරඟ විභාගයක ප්‍රතිඵල මගින් බඳවා ගනු ලැබේ.

පුරප්පාඩු වලින් 75% විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ද, 25% සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ද සම්පූර්ණ කරනු ලැබේ.

- පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් තරම් අයදුම්කරුවන් සංඛ්‍යාවක් විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් නොලබන්නේ නම් එම පුරප්පාඩු සංඛ්‍යාව සීමිත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කිරීමටත්, පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් තරම් අයදුම්කරුවන් සංඛ්‍යාවක් සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් නොලබන්නේ නම් එම පුරප්පාඩු සංඛ්‍යාව විවෘත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

පවතින පුරප්පාඩු සංඛ්‍යාව **22** කි.

**03.** **සුදුසුකම්:-**

මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම පහත සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**3.1**

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත අය විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට "**පූර්වාසන්න වසර 03ක කාලය තුළ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය හෝ පූර්වාසන්න වසර 03ක කාලය තුළ කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමඟ අයදුම්කරුගේ එක් වසරක ස්ථිර පදිංචිය**" සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.
(අ). මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්දහිමි නාම ලේඛන උද්ධෘතය.
(ආ).ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය.

IV. දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

**3.2** **අධ්‍යාපන සුදුසුකම්:-**

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක් (01) වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර සමත්ව තිබීම. එසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 අනුව, කිසියම් අයදුම්කරුවකු ජාතික වෘත්තිය කුසලතාවයන් හි **(NVQ) 4** මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අධ්‍යයන පොදු සහකිත පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම හා සමාන ලෙස සලකනු ලැබේ.

**3.3** **වෘත්තීය සුදුසුකම්:-**

රජය හෝ රජය පිළිගත් ආයතනයක් මගින් පවත්වන ලද අලෙවි කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් හය (06) මාසික පාඨමාලාවක් හදාරා අවසන් සහතිකය ලබා තිබීම.

**3.4** **පළපුරුද්ද:-**

1. අවම වශයෙන් හය (06) මාසික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
2. අලෙවි කටයුතුවලදී පාරිභෝගිකයන් සමග ඉංග්‍රීසි බසින් කටයුතු කිරීමේ හැකියාව.
3. අලෙවි ආයතනයක අලෙවි කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.

**04.** **වයස:-**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

**05.** **වැටුප් ක්‍රමය:-**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයට අදාල වැටුප් කාණ්ඩය MN1- 2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 27,140-10x300-11x350-10x495-10x660-45,540 වේ.

**06.** **විභාග ගාස්තු**

මෙම විභාගයේ විභාග ගාස්තු ලෙස රු. 600.00 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලංකා බැංකුවේ ගාල්ල කොටුව ශාඛාවේ ගිණුම් අංක **87262909** දරන **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත** යන ජංගම ගිණුම ට බැර කළ යුතු අතර, මුදල් තැන්පතු පත්‍රිකාවේ අයදුම්කරුගේ **ජාතික හැඳුනුම්පත් අංකය** හා මෙම විභාගයට අදාල විභාග **කේත අංකය** වන **OC21602** යන්න සඳහන් කළ යුතු ය.

උදා:-

| | |
|---|---|
| ගිණුම් අංකය - | **87262909** |
| ගිණුම් හිමියාගේ නම සහ ලිපිනය - | **ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** |
| ජා.හැ.ප./ ගමන්බලපත්/ රියදුරු බලපත් අංකය - | අයදුම්කරුගේ **ජාතික හැඳුනුම්පත් අංකය** |
| දුරකථන අංකය - | අයදුම්කරුගේ **ජංගම දුරකථන අංකය** |
| තැන්පතුවේ අවශ්‍යතාවය - | **OC21602** |

මුදල් ගෙවූ රිසිට් පත අනිවාර්යයෙන්ම සුරැකි ව තබා ගත යුතු අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය. කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**සටහන:** විභාග ගාස්තු ගෙවීම ඉහත සඳහන් බැංකු ගිණුමට පමණක් සිදු කළ යුතු අතර, වෙනත් කිසිදු අයුරකින් ගෙවීම් සිදු කළ නොහැක.

**07.** **අයදුම්කිරීම**

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මඟින් අන්තර්ජාලය හරහා මාර්ගගතව 2021 අප්‍රේල් 30 දින හෝ ඊට පෙර අයදුම් කළ යුතු ය.

07.1 අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි වීමේදී සෑම අයදුම්කරුවෙකු සතුව වලංගු ජාතික හැඳුනුම්පතක්, ඔබගේ හෝ ඔබට තොරතුරු සැපයීමට හැකි ළඟම පුරවැසියෙකුගේ සක්‍රීය ජංගම දුරකතන අංකයක් හා විභාග ගාස්තුව ගෙවූ රිසිට්පතද තිබීම අත්‍යවශ්‍ය වේ. විභාගය පිළිබඳ සියලුම තොරතුරු පසුව දැනුම් දෙනු ලබන්නේ ඔබ විසින් සපයන ලද ජංගම දුරකතන අංකය හරහා වේ. විභාග නිවේදනයට පරිබාහිරව යොමුකරන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් හොඳින් කියවා, එහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගෙන එහි සඳහන් නීති රීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.

**සටහන:** ලියාපදිංචිය මාර්ගගතව පමණක් සිදු කරන බැවින්, කිසිදු ලෙසකින් අයදුම්පත්වල දෘඪ පිටපත් (Hard Copy) මෙම කාර්යාලය වෙත එවීම අවශ්‍ය නොවේ.

07.2 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ මාර්ගගත ව අයදුම්කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

**08.0** අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දුරකථන අංක 091-2234309 / 0912248450 ඔස්සේ දැන්විය යුතුය.

I. විභාගයේ නම
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම
III. සම්පූර්ණ ලිපිනය
IV. විභාග ගාස්තුව ගෙවූ බැංකු ශාඛාව හා ගෙවූ දිනය
V. විභාගය සඳහා ලියාපදිංචි වූ දිනය

**09.0 සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි**

(අ). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. මෙම විභාගයෙන් දකුණු පළාත්, කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 (**MN**-1) **III** ශ්‍රේණියේ අලෙවි කළමනාකරු තනතුරට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ ව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

(ආ). තෝරා ගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටී නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත් වනු ඇත.

**10.0** මාධ්‍ය
විභාගය සිංහල, දෙමළ , ඉංග්‍රීසි භාෂා මාධ්‍ය තුනෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**11.0 විභාග ක්‍රමය**

මෙම විභාගය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ.

| ප්‍රශ්නපත්‍රයේ නම | කාලය | ලකුණු |
|---|---|---|
| අභියෝග්‍යතාව | පැය 01 1/2 යි. | 100 |
| අලෙවි කළමනාකරණය | පැය 02 යි. | 100 |

1. **අභියෝග්‍යතාව -** මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

2. **අලෙවි කළමනාකරණය -** අලෙවිකරණය අර්ථදැක්වීම හා විකාශනයේ වැදගත්කම, අලෙවිකරණ හර සංකල්ප, අලෙවිකරණ සංකල්ප, අලෙවිකරණ පර්යේෂණ, අලෙවිකරණ මිශ්‍රය, සන්නම, ඇසුරුම්කරණය, මිල, බෙදාහැරීමේ මාර්ග, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය, මහජන සම්බන්ධතා, ඍජු අලෙවිරණය යන මාතෘකා ආවරණය අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙන් **40%** ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් **50%** ක් වත් ලබාගත යුතු වේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ලිඛිත පරීක්ෂණයේදී සමත් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සහ ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

සුදුසුකම් පරික්ෂා කිරීම ද මෙම සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරේ.

## 12.0 විභාගය පැවැත්වීමට යෝජිත නගර

විභාගය ගාල්ල නගරයේ පිහිටුවන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ඇත.

## 13.0 තෝරා ගැනීමේ ක්‍රමය

(අ). මෙම තනතුරු සඳහා ඉහත 10 ඡේදයේ දක්වා ඇති පරික්ෂණවලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

- පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.
- යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

## 14.0 සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

**ගාමිණී වීරවික්‍රම**
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2021.04.07 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
6 වන මහල, ගාල්ල.

**(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහිත අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)**